# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,911 — 1970 ජූනි 18 වැනි බ්‍රහස්පතින්ද — 1970.6.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගවලට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 439 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 449 |
| කනතුරු-ඇබෑර්තු ... ... ... | 442 | අය-වැය ලේඛන ... ... ... | 450 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 444 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 448 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥපනත යටතේ දැන්වීම ... | 448 | විවිධ දැන්වීම ... ... ... ... | 452 |


## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970.5.19 දින,
කොළඹ දී ය.

#### ආඥාව

1967 දෙසැම්බර් 28 දින අංක 14,780/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවකින් සංශෝධිත, 1967 අගෝස්තු මස 16 දින අංක 14,761/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ සඳහන් අම්පාරේ දිස්ත්‍රික්කයේ සමාන්තුරෙයිපත්තු ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ සමාන්තුරෙයි නැගෙනහිර ගම් ප්‍රදේශයේ බෙදීමට අදාළ වූ කරුණු ක්‍රියාත්මක කිරීමට මෙහි උපලේඛනයේ සඳහන් පරිදි විධිවිධාන සලස්වනු ලැබේ.

#### උපලේඛනය

1. එක් එක් අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, එකී අළුත් ගම් ප්‍රදේශයට අදාල විය හැකි ගම් සභා ආඥාපනතේ සියළුම කායයීයන් සඳහා පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ අනුප්‍රාප්තික සභාව වශයෙන් සැලකිය යුතුය.

2. පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව 1968 ජූනි 30 වැනි දිනට වලංගුව පවත්නා සියළුම අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයට අදාල ප්‍රමාණයට එකී එක් එක් අළුත් ගම් ප්‍රදේශය තුළ වලංගුව පැවතිය යුතු අතර, එම අතුරු ව්‍යවස්ථා එකී අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිත ලෙස සැලකිය යුතුය.

3. 1968 ජූනි 30 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම් සභාවේ පොදු අරමුදලට බැර කරනු ලැබ ඇති මුදල් ප්‍රමාණය, 1968 ජූලි මස 1 වැනි දින දී 4 : 3 : 3 : අනුපාතයට පිළිවෙලින් නාවිතන්වේලි මල්වත්තෙයි හා සමාන්තුරෙයි යන අළුත් ගම් ප්‍රදේශයන්හි ගම්සභාවන්හි පොදු අරමුදලට බැර කළ යුතුය.

4. 1968 ජූනි 30 වැනි දිනට පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී ඇති හෝ එහි පාලනය යටතේ ඇති හෝ මීට යා කොට ඇති ඇමුණුමෙහි සඳහන් චංචල දේපල 1968 ජූලි මස 1 වැනි

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

දින දී නවිතන්වේලි අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව කෙරෙහි පවරන ලද සේ සැලකිය යුතුය.

5. 1968 ජූලි 30 වන දින දී පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාව කෙරෙහි පැවරී ඇති හෝ එහි පාලනය යටතේ ඇති එක් එක් ඉඩම්, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපල, 1968 ජූලි මස 1 දින සිට එකී ඉඩම්, ගොඩනැගිලි හෝ අනිකුත් නිශ්චල දේපල පිහිටියාවූ අළුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පැවරී ඇති ලෙස සැලකිය යුතුය.

6. පැරණි ගම් ප්‍රදේශයේ ගම්සභාවේ අයිතිවාසිකම්, ණයතුරුස්, බැරකම් හා බැඳීම් සියල්ලක්ම, ඒවා එක් එක් අළුත් ප්‍රදේශයට අදාළ ප්‍රමාණයට 1968 ජූලි 1 වැනි දින සිට එකී අළුත් ප්‍රදේශයේ ගම් සභාවට මාරු කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

7. පැරණි ගම් සභාවේ සේවය කළ සේවකයන් හට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වූ දායක මුදල්, පිළිබඳ එකී ගම් සභාවේ බැරකම්, 4 : 3 : 3 අනුපාතයට නවිතන්වේලි, මල්වත්තෙයි හා සමන් තුරෙයි නව ගම් ප්‍රදේශයන්හි ගම්සභා අතර බෙදීය යුතුය.

8. මෙම උපලේඛනයේ—

(අ) වෙනත් අන්දමකින් සඳහන් කරනු ලැබුවහොත් මිස "අළුත් ගම් ප්‍රදේශය" යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1967 දෙසැම්බර් මස 28 වැනි දින හා අංක 14,780/7 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙන් සංශෝධිත 1967 අගෝස්තු 16 වැනි දින අංක 14,761/7 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවට අදාළ උපලේඛනයේ විස්තර කර ඇති නවිතන්වේලි ප්‍රදේශය හෝ මල්වත්තෙයි ගම් ප්‍රදේශය හෝ සමාන්තුරෙයි ගම් ප්‍රදේශය වේ.

(ආ) "පැරණි ගම් ප්‍රදේශය" යනුවෙන් අදහස් කෙරෙනුයේ නවිතන්වේලි මල්වත්තෙයි හා සමාන්තුරෙයි නව ගම් ප්‍රදේශයන් සැදුම් ලත් පෙර පැවති, සමන්තුරෙයි නැගෙනහිර ගම් ප්‍රදේශය ය.

### අදාළ ලේඛනය

| | | | |
|---|---|---|---|
| කාර්යාල මේස | ... | ... | 2 |
| රැස්වීම් මේස | ... | ... | 1 |
| පුටු ... | ... | ... | 19 |
| කාර්යාලයීය බන්දේසි | ... | ... | 2 |
| ලී අල්මාරි | ... | ... | 1 |
| බංකු ... | ... | ... | 2 |
| පොඩි මේස | ... | ... | 1 |
| පා පැදි | ... | ... | 1 |
| යතුරු ලියන යන්ත්‍ර (ඉංග්‍රීසි) | | ... | 1 |
| සිතියම් ... | ... | ... | 1 |
| දැන්වීම් පුවරු | ... | ... | 1 |
| කැඳවීමේ සීනු | ... | ... | 1 |
| වානේ කැබිනෙට්ටු | ... | ... | 1 |
| ලී කැබිනෙට්ටු | ... | ... | 1 |
| මිනුම් පටි පෙට්ටි | .. | ... | 1 |

6–501—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඕ.—බී. 34/54.

## හොරණ නගර සභාව

### තානායම් පනත

(275 වැනි අධිකාරිය වන) තානායම් පනතේ 4 වැනි වගන්තිය යටතේ ඒ සඳහා උචිත බලධරයා වන හොරණනගර සභාව විසින් හොරණ තානායම වෙනුවෙන් සම්පාදිතව, එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිරලේකම්.

1970. 5. 24.

### ව්‍යවස්ථා

1. තානායමේ යම් කොටසක් කාර්යාලයක් වශයෙන් හෝ ව්‍යාපාරික ස්ථානයක් වශයෙන් පරිහරනය කරන සෑම තැනැත්තෙක්ම, ඔහු තානායමේ නැවතී සිටින කාලයට මෙහි වූ උපලේඛනයේ සඳහන් වන නැවතී සිටීමේ ගාස්තුවලට අමතරව, පැයකට වැඩි නොවන සෑම කාල සීමාවක් සඳහාම රුපියල් එකක විශෙෂ ගාස්තුවක් ගෙවිය යුතුය. තානායමට පැමිණෙන අනිකුත් අමුත්තන්ගේ සැප පහසුව තකා, එසේ තානායම පරිහරනය නොකරන ලෙස තානායම් භාරකරු විසින්, ඉල්ලා සිටියහොත්, ඒ අයුරින් තානායම පරිහරනය කරන සෑම අයෙක්ම එසේ කිරීමෙන් වැළකී සිටිය යුතුය.

2. (1) තානායමේ යම් කොටසක් පාවිච්චි කරන හෝ එහි නැවතී සිටින සෑම තැනැත්තෙකු විසින්ම මෙහි වූ උපලේඛනයේ දැක්වෙන ප්‍රමාණයන් අනුව නැවතී සිටීමේ ගාස්තුවක් ගෙවිය යුතුය.

(2) පහත සඳහන් අය සම්බන්ධයෙන් ගාස්තුවක් අය නොකල යුතුය :—

(අ) අත දරුවකු,

(ආ) තානායමට පැමිණෙන අමුත්තෙකුගේ වැඩකටයුතු කරමින්, මෝටර් රථය තුල හෝ ගරාජය තුල නිදා ගන්නා සේවකයෙකු හා,

(ඇ) තානායමේ භූමියේ ගරාජයක නවතා තබන යම් මෝටර් රථයක රියැදුරෙකු, ඔහු මෝටර් රථයේ හෝ ගරාජයේ නිදාගන්නේ නම්.

3. (i) සෑම අමුත්තෙකු විසින්ම තමා තානායමට පැමිණිවිට තානායමට පැමිණෙන අමුත්තන්ගේ පොතෙහි ඔහුගේ හෝ ඇගේ නම සහ ලිපිනය පැහැදිලිව ලිවිය යුතුය.

(ii) පූර්වෝක්ත ඡේදයෙහි වූ නියමයන් පිළිපදිනු ලබනතුරු කිසිම ආගන්තුකයෙකු විසින් තානායමේ යම්කිසි කොටසක නැවතී නොසිටිය යුතුය. එමෙන්ම ඔහුට කෑමබීම සැපයීමද නොකළ යුතුය.

4. (i) සභාපතිතුමාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිවෙකු විසින් අනුක්‍රමිකව දින තුනකට වඩා වැඩි කාලයක් තානායමේ කිසිම කොටසක නැවතී නොසිටිය යුතුය.

(ii) ඉහතකී පරිදි අවසරයක් නොලබා තානායමේ නැවතී සිටින සෑම කෙනෙකු විසින්ම, තෙදින ඉකුත්වීමෙන් පසුව තානායමෙන් ඉවත්ව යා යුතුය.

5. අමුත්තෙකු විසින් ගෙවනු ලබන සියළුම අයකිරීම්, තානායම් භාරකරු විසින් ඒ කාර්යය සඳහා තබා ඇති ලේඛනයේ විධිමත් පරිදි ඇතුලත් කළ යුතුය.

6. අමුත්තෙකු විසින් ගෙවිය යුතු තානායම් ගාස්තු හෝ අය කිරීම්, ඉල්ලා සිටිවිට මුදලින් ගෙවිය යුතු අතර එසේ ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, ඒ අමුත්තාට ඉදිරියටත් කෑමබීම සැපයීම ප්‍රතික්ෂෙප කිරීමට තානායම් භාරකරුට හිමිකම් තිබිය යුතුය.

7. (i) යටත් පිරිසෙයින් එක් දිනකටවත් කලින් වෙන්කරවා නොගත්තේ නම්, කිසිම අමුත්තෙක් සඳහා කිසිම කාමරයක් ඔහු වෙනුවෙන් වෙන්කර නොතැබිය යුතුය.

(ii) මෙම ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයෙහි වූ විධි විධාන අනුව, කාමරයක් කලින් වෙන්කරවා තැබූ තැනැත්තකු විසින්, ඔහු එහි නැවතී නොසිටියද ඒ සඳහා ගාස්තු ගෙවිය යුතුය.

(iii) කාමරය කලින් වෙන් කරවා ගත් තැනැත්තා හෝ තැනැත්තන් පැමිණෙන තුරු එබඳු කාමරයක් වෙනත් තැනැත්තන්ගේ පරිහරණය සඳහා තිබිය යුතුය.

8. කාමර කලින් වෙන්කරවා ගැනීම සඳහා එවනු ලබන සෑම ඉල්ලීමක්ම තානායමේ භාරකරු නමින් ලියවිල්ලකින් එවිය යුතුය.

9. එවන අයගේ නම සහ ලිපිනය එහි සඳහන්ව ඇතොත් මිස කෑම බීම සූදානම් කර තබන ලෙස ඉල්ලා එවනු ලබන විදුලි පණිවුඩ අනුව ක්‍රියා කිරීමට තානායම් භාරකරු බැඳී නොසිටිය යුතුය.

10. තානායමේ ඇඳක, සෝපාවක හෝ කවිච්චියක, ඇතිරිල්ලක් දමා තිබුණොත් මිස, එය නිදාගැනීම සඳහා පාවිච්චි නොකළ යුතුය.

11. අමුත්තෙකු විසින් හානි කරන ලද හෝ කඩන ලද සියළුම බඩුභාහිරාදියේ වටිනාකම තානායමේ දැන්වීම් පුවරුවේ ප්‍රසිද්ධියට පමුණුවා ඇති අයකිරීම් ප්‍රමාණයන් අනුව ඒ අමුත්තා විසින් ගෙවිය යුතුය.

12. (i) අමුත්තෙකු විසින් තානායම හෝ තානායම් භාරකරු ගැන කිරීමට අදහස් කරන යම් පැමිණිල්ලක් තානායමේ තබා ඇති පැමිණිලි පොතේ සඳහන් කළ යුතුය.

(ii) යම් අමුත්තෙකු විසින් පැමිණිලි පොත ඉල්ලා සිටි විටක එය ඉදිරිපත් කිරීම තානායම් භාරකරුගේ යුතුකම විය යුතුය.

(iii) තානායම පිළිබඳ යම් විවේචනයක් හෝ පැමිණිල්ලක් තානායම් ගාස්තු ඇතුළත් කරන ලේඛනයේ සටහන් නො කළ යුතුය.

13. (i) සභාපතිතුමාගේ ලිඛිත අවසරයක් නොමැතිව තානායම් භූමියේ කිසිදු ප්‍රසිද්ධ දිවා භෝජන සංග්‍රහයක්, රාත්‍රී භෝජන සංග්‍රහයක්, උද්‍යාන ප්‍රිය සම්භාෂණයක් හෝ වෙනත් පිළිගැනීමේ උත්සවයක් හෝ ප්‍රීති උත්සවයක් නොපැවැත් විය යුතු අතර, එබඳු සෑම ප්‍රසිද්ධ දිවා භෝජන සංග්‍රහයක්, රාත්‍රී භෝජන සංග්‍රහයක්, උද්‍යාන ප්‍රිය සම්භාෂණයක් හෝ පිළිගැනීමේ උත්සවයක් හෝ ප්‍රීති උත්සවයක් ඒ තානායමේ නැවතී සිටින අනිකුත් අමුත්තන්ට කරදරයක් නොවන අයුරු පැවැත්විය යුතුය.

(ii) මෙහි (1) ඡේදයේ නිශ්චිතව සඳහන් කාර්යයන්ගෙන් යම් කාර්යයක් සඳහා සම්පූර්ණ තානායම හෝ තානායමෙන් යම් කොටසක් පාවිච්චි කිරීමට සභාපතිතුමා විසින් අවසර දෙනු ලබන අවස්ථාවක,

(අ) පැමිණෙන අමුත්තන්ගේ ගණන විසිහතර දෙනෙකුට වඩා වැඩි නොවන විට (මීට යාකොට ඇති උපලේඛනයේ දැක්වෙන නැවතීම් ගාස්තු වෙනුවට) පළමු පැය හය සඳහා රු. 15 ක්ද සෑම අමතර පැයකට හෝ ඉන් කොටසකට රු. 2 ක්ද, සහ

(ආ) පැමිණෙන අමුත්තන්ගේ ගණන විසිහතර දෙනකුට වඩා වැඩි වනවිට, මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් ගණන් ප්‍රමාණ අනුව නතරවීමේ ගාස්තුද සභාව වෙත ගෙවිය යුතුය.

14. තානායමේ නැවතී නොසිටින අයට වඩා ඇත්ත වශයෙන්ම එහි නැවතී සිටින අයට තානායමට සම්බන්ධ වූ ගරාජයක් හෝ ඉස්තාලයක් පාවිච්චි කිරීමේ අයිතිවාසිකම තිබිය යුතුය.

15. තානායමේ ගරාජයක නතරකර තිබෙන හෝ තානායම් භූමිය ඇතුලත යම් ස්ථානයක නවතා තිබෙන පෞද්ගලික වාහනයක අයිතිකරු හෝ එය කුලියට ගත් තැනැත්තෙක් විසින් තමා තානායමේ නැවතී නොසිටියද ඒ වාහනය නවතා තිබීමේ හෝ ගරාජය පාවිච්චි කිරීමේ ගාස්තුවට අමතර වශයෙන් එකී වාහනය එසේ නතර කොට හෝ නවතා තිබෙන කාලය තුල තානායමේ නැවතී සිටීමේ උචිත ගාස්තුවද ගෙවිය යුතුය.

16. මේ ව්‍යවස්ථා වලින් යම් ව්‍යවස්ථාවක් කඩකිරීමේ වරදට වරදකරුවූ යම් අමුත්තෙකු විසින් තානායම පාවිච්චි කිරීම, සභාපතිතුමා විසින් තහනම් කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

17. තානායම් භාරකරු විසින් යම් අසභ්‍ය කාර්යයන් සඳහා තානායමේ යම් කොටසක නැවතීමට යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට අවසර නොදිය යුතුය.

18. කිසිම අමුත්තෙකු හෝ අමුත්තෙකුගේ සේවකයෙකු විසින් තානායම පාවිච්චි කරන අනිකුත් අයට හිරිහැර වන අයුරු අනිසිලෙස නොහැසිරිය යුතුය.

19. තානායමට බල්ලෙකු රැගෙන ඒමට කිසිම අමුත්තෙකුට අවසර නොදිය යුතුය.

20. සභාවට අදාල යම් කරුණක් සම්බන්ධයෙන් රාජකාර්යයෙහි යෙදී සිටියදී තානායමේ නැවතී සිටින රජයේ හෝ පළාත් පාලන සේවයේ යම් සේවකයෙකුගෙන් නැවතී සිටීම සඳහා මීට යාකොට ඇති උපලේඛනයේ නිශ්චිතව සඳහන් ගාස්තු ප්‍රමාණවලින් භාගයක් අයකළ යුතුය.

21. මේ ව්‍යවස්ථාවල යම් ව්‍යවස්ථාවක් කඩකිරීම සම්බන්ධයෙන් රුපියල් පහකට වැඩි නොවන දඩයක් සහිත දඬුවම් පැමිණවිය යුතුය.

22. මේ ව්‍යවස්ථාවල—

"සභාපතිතුමා" යනුවෙන් නගර සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ.

"සභාව" යනුවෙන් හොරණ නගර සභාව අදහස් කරනු ලැබේ. තවද,

"තානායම" යනුවෙන් හොරණ තානායම අදහස් කරනු ලැබේ.

23. 1955 පෙබරවාරි මස 3 වැනි දින අංක 10,762 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ හොරණ තානායමට අදාල ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

## උපලේඛනය

### නැවතී සිටීමේ ගාස්තු

| | රු. | ශ. |
|---|---|---|
| 1. තානායමේ නැවතී සිටින එහෙත් එහි ඇඳක් පාවිච්චි නොකරන එක් එක් තැනැත්තකු සම්බන්ධයෙන්— | | |
| (අ) පැය එකකට වැඩි නොවන කාල සීමාවක් සඳහා: | | |
| (i) ස්ථානයේදී සවස තේ පමණක් ගන්නා විට ... ... | 0 | 15 |
| (ii) ස්ථානයේදී (සවස තේ පානය හැර කෑම වේලක් ගන්නාවිට ... ... | 0 | 30 |
| (ආ) පැය එකකට වැඩි එහෙත් පැය දෙකකට අඩු කාල සීමාවක් සඳහා: | | |
| (i) ස්ථානයේදී සවස තේ පමණක් ගන්නා විට ... ... | 0 | 30 |
| (ii) ස්ථානයේදී (සවස තේ පානය හැර) කෑම වේලක් ගන්නා විට ... | 0 | 45 |
| (ඇ) පැය දෙකකට වැඩි එහෙත් පැය එකොලහකට නොවැඩි කාල සීමාවක් සඳහා එක් එක් පැයකට හෝ ඉන් කොටසකට ... | 0 | 15 |
| (ඈ) පැය එකොළහකට වැඩි එහෙත් පැය දොලහකට නොවැඩි කාලසීමාවක් සඳහා ... | 2 | 40 |
| (ඉ) පැය දොලහකට වැඩි එහෙත් පැය දහසයකට නොවැඩි කාල සීමාවක් සඳහා ... ... | 2 | 70 |
| (ඊ) පැය දහසයකට වැඩි එහෙත් පැය විසිහතරකට නොවැඩි කාලසීමාවක් සඳහා ... | 3 | 0 |
| 2. තානායමේ නැවතී නිදාගැනීම සඳහා එහි ඇඳන් පාවිච්චි කරමින් කෑම වේලක් ගන්නා එක් එක් තැනැත්තකු සම්බන්ධයෙන්— | | |
| (අ) නැවතී සිටීමේ කාලසීමාව පැය හතරකට වඩා වැඩි නොවන විට එක් එක් පැය හෝ ඉන් කොටසකට ... ... ... | 0 | 75 |
| (ආ) නැවතී සිටීමේ කාලසීමාව පැය හතරකට වඩා වැඩි වන එහෙත් පැය විසි හතරකට වැඩි නොවන විට ... ... ... | 3 | 0 |
| 3. පැය විසිහතරක කාල සීමාවක් සඳහා තානායමේ ඇඳන්ද සහිත කාමරයක නැවතී තානායමේදී කෑම නොගන්නා එක් එක් තැනැත්තකු සම්බන්ධයෙන් ... ... | 5 | 0 |
| 4. තානායමේ (ගරාජයේ නතර නොකරන) එක් මෝටර් රථයක් හෝ මෝටර් බයිසිකලයක් සම්බන්ධයෙන්— | | |
| (අ) පැය හයකට වැඩි නොවන යම් කාලසීමාවක් සඳහා—අයකිරීමක් නැත. | | |
| (ආ) පැය හයකට වැඩිවන එහෙත් පැය විසිහතරකට වැඩි නොවන කාලසීමාවක් සඳහා ... | 0 | 50 |
| 5. තානායමේ (ගරාජයේ නතරකර තිබෙන) එක් එක් මෝටර් රථයක් හෝ මෝටර් බයිසිකලයක් සම්බන්ධයෙන්— | | |
| (අ) පැය හයකට වැඩි නොවන යම්කිසි කාලසීමාවක් සඳහා—අයකිරීමක් නැත. | | |
| (ආ) පැය හයකට වැඩි වන එහෙත් පැය විසිහතරකට වැඩි නොවන කාලසීමාවක් සඳහා ... | 0 | 50 |
| (ඇ) එක් එක් සම්පූර්ණ මාසයම සඳහා ... | 10 | 0 |

6–343—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරු කරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන්ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාටම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

4. නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්‍ය්‍ය සඳහාත් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස " නව ප්‍රවේශක නිලධාරීන්ටත් " නියම කරනු ලැබේ.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබේ.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකි වන අතර, නියමිත කාලසීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුලතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදළ වන පොදු කොන්දේසි බලන්න).

(ඇ) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සැම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්වවූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියාවූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.

(ඇ) කාර්යක්ෂමතා කඩයිම.—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්‍ය්‍යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා " නව ප්‍රවේශක නිලධාරීහු " සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරණ කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන 1.—මේ කරුණ සම්බන්ධයෙන් " නව ප්‍රවේශක නිලධාරි " යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන්ය.

සටහන 2.—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ " ආදි ප්‍රවේශක නිලධාරීන් " කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) (අ), (ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදළ නොවේ.

5. අවශ්‍ය සුදුසුකම්.—සැම අයදුම්කරුවකු විසින්ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා " ලාංකික " යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ පුරවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්තවූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන

අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාගන්නට තමන් සූදානමව සිටිත්ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපෑලේදී, ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

**අත්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය**

## පළාත් පාලන සේවය

සැ.යු.–(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙලකිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්වලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රිසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා ඇති තනතුර සම්බන්ධයෙන් අදාළ වන වෘත්ත්‍ය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය:————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස.
අවුරුදු :————. මාස :————, දින :————

(ආ) උපන් දිනය :————

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නුපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| --- | --- | --- | --- |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
| --- | --- | --- | --- |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයක් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතනය හා කාලසීමාවන් :————

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. **විශෙෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද?:————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### වැලිසෝන් ක්‍රියාකරු තනතුර (ගැහැණු)

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප වර්ෂයකට රු. 3,000—90×11—රු. 3,990. මෙහි රු. 3,450 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමකි.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) වයස.—1970.7.7 වැනි දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ පහත සඳහන් විභාගවලින් සමත් වී සිටිය යුත් තාහ :—

(i) (ඒ) ඉංග්‍රීසි, (බී) සිංහල/දෙමළ සහ (සී) අංක ගණිතය/ගණිතය යන විෂයයන් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ;

(ii) (ඒ) ඉංග්‍රීසි, (බී) සිංහල/දෙමළ සහ (සී) අංක ගණිතය/ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි අවස්ථා ගණනකදී සමත් පොදු අධ්‍යයන (සාමාන්‍ය) සහතිකය ;

(iii) අයදුම්කරුවන්ට වැලිපෝන් ක්‍රියාකරුවකු ලෙස දෑවුරුද්දකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය. අධ්‍යාපන සහතික සහ වැලිපෝන් ක්‍රියාකරුවකු ලෙස පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද (මුල් පිට පත් නොවේ.) ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ 8 වැනි කොටුවෙහි (අධ්‍යාපන සුදුසුකම්) සම්මාන සාමාර්ථ්‍යය ලබා ඇති විෂයයන් සඳහන් කළ යුතුය ;

(iv) දෙමළ කථා කිරීමේ දැනුම වාසියක් වේ.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1970.7.7 වැනි දිනට හෝ ඊට පළමු, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජූනි මස 5 වැනි දින,
කොළඹ තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

2–514—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, 1970.8.22

පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස් විසිනි.

2. **අයදුම්පත්—**

(ඒ) විභාගයට ඇතුළත් වීමේ අයදුම්පත් මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියල කොට, "ලේකම්, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530, කොළඹ 1" යන ලිපිනයට එවිය යුතුයි.

(බී) අයදුම්පත් 1970.7.7 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(සී) අයදුම්කරුවන් සිය අයදුම්පත්, තමා දැනට සේවයේ නියුක්ත ප්‍රාදේශීය බලමංඩලයේ ප්‍රධානතුමා මගින් එවිය යුතුයි. මෙසේ කිරීමට යම් අපේක්ෂකයකු අපොහොසත් වුවහොත්, ඔහු නුසුදුස්සෙකු ලෙස සළකනු ලැබේ.

(ඩී) 1970.7.7 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන ප්‍රාදේශීය බලමංඩලයේ ප්‍රධානතුමා වෙත සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලබේ.

3 **විභාගයට ඇතුළත් කර ගැනීම—**

(i) පිළිගනු ලැබූ අයදුම්පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(ii) අයදුම්කරවන් තමනට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුයි. තමාට නියමකොට ඇති විභාග ශාලාව ඇරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(iii) ප්‍රවේශ පත්‍රයත් සමග කාල සටහන් පිටපතක් ද අපේක්ෂක යින් වෙත එවනු ලැබේ. විභාගයට පෙනී සිටින සෑම අයදුම් කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයෙහි දී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිළධාරියාට භාරදිය යුතුයි.

(iv) විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් පළමු, ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව වහාම "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ 1" යන ලිපිනයට දැනුම්දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම්දෙන අතරම, පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතුයි :—

(අ) විභාගයේ නම ;

(ආ) අයදුම්කරුගේ සම්පූර්ණ නම ;

(ඇ) සම්පූර්ණ ලිපිනය ;

**සැළකිය යුතුයි :**—විභාගයට ඇතුළත් කර ගැනීම, ඊට සුදුසුකම් පිළි ගැනීමක් ලෙස සළකනු නොලැබේ.

4. මේ විභාගයේ නිති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුලත්වීම අවලංගු කරන්නට පිළිවන.

5. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පිළිගනු ලැබූ අයදුම්පත් හිමි ප්‍රාදේශිය බලමංඩලවල සේවයේ නියුක්ත නිළධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස ප්‍රදේශීය බලමංඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

6. **හඳුනා ගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පසා විභාග ශාලා භාර නිළධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක්.

(බී) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්.

(සී) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායා රූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

(ඩී) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයෙකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායා රූපයක් පසු පිටෙහි මෙදන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායා රූපයක්.

පසු පිටෙහි සඳහන් ඡායා රූපය මෙහි අත්සන් කර ඇති ....................................යන අයගේ බව මම සහතික
(අයදුම්කරුගේ නම)
කරමි.

....................................
(අයදුම්කරුගේ අත්සන)

....................................
(අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන)

නම හා තරාතිරම :....................................

දිනය :........................

විභාග ශාලාවේ දී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

7. **විභාග පරිපාටිය.**—පහත සඳහන් වන්නේ විභාගය සඳහා නියමිත විෂයයන් හා ඒ ඒ විෂයයන් සඳහා නියමිත ලකුණුත් ය :—

(ඒ) සිංහල, දෙමළ ජාතික භාෂා දෙක, මෙම පරීක්ෂණය-කොටස් දෙකකින් යුක්ත වේ. එනම්—

| | | ලකුණු |
|---|---|---|
| (i) සාකච්ඡා හා අර්ථ නිරූපනය | ... | 100 |
| (ii) කියවීම හා ලිවීම | ... | 100 |

ඉහත සඳහන් (ඒ) (i) නීතිය යටතේ කරනු ලබන පරීක්ෂණයේ දී අයදුම්කරුගේ, වෙනස් වෙනස් තරාතිරම්වල සිංහල හෝ දෙමළ හෝ අවබෝධ කර ගැනීමේ ශක්තියත්, සාමාන්‍ය සාකච්ඡාවලදී සහ රාජකාරි කටයුතුවල දී ඒ භාෂා දෙක තේරුම් ගැනීමේ ශක්තියත් පිළිබඳව පරීක්ෂකයා තෘප්තිමත් කිරීම පිණිස වාචික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. පරීක්ෂකවරුන් සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුමක් නැති සිංහල සහ දෙමළ පුද්ගලයින් අතර භාෂා පරිවර්තකයෙකු ලෙස ක්‍රියා කිරීමටද ඔහුට නියම කරනු ලැබේ. මෙහිදී භාෂා පරිවර්තනය කරනු ලබන්නේ සාමාන්‍ය රාජකාරි කටයුතුවලට අදාළ දේ සම්බන්ධයෙනි. මේ පරීක්ෂණයේ දී සම්පූර්ණ ලකුණුවලින් සියයට 40 ක් අයදුම්කරු විසින් ලබාගැනීම අවශ්‍ය වේ.

| | | ලකුණු |
|---|---|---|
| (බී) පළාත් පාලන ආයතනවල භාවිත වන ගිණුම් සහ 19 වැනි සහ 20 වැනි ඡේදයන් හැර, ආණ්ඩුවේ මුදල් රෙගුලාසිවල දෙවැනි කොටස (පැය 2 යි) | ... | 100 |
| (සී) පළාත් පාලන නීති (පැය 2 යි) | ... | 100 |

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. එනම්

**1 වැනි කොටස.**—නගර සභා, පළාත් ආණ්ඩු සභා සහ සුළු නගර සභා ආඥපනතේ, ඒවා යටතේ සම්පාදිත නීති සහ අතුරු ව්‍යවස්ථා සහ පළාත් පාලන ආඥපනත් හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසි පදනම් කරගෙන, මෙම කොටසේ ප්‍රශ්න පිළියෙල කරනු ලැබේ.

**2 වැනි කොටස.**—මෙම කොටසේ ප්‍රශ්න පිළියල කරනු ලබන්නේ පහත සඳහන් ආඥපනත් ඒ යටතේ සම්පාදිත නීති, රෙගුලාසි සහ අතුරු ව්‍යවස්ථා පදනම් කරගෙනය :—

(ඒ) (i) වෙන්දේසිකරුවන් සහ තැරැව්කරුවන් පිළිබඳ ආඥපනත ;

(ii) සුසාන භූමි ආඥපනත ;

(iii) ගෝඝාතක ආඥපනත ;

(iv) ප්‍රාදේශිය බලමංඩල සම්මත අතුරු ව්‍යවස්ථා පනත ;

(v) බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥපනත ;

(vi) විදුලි බල ආඥපනත ;

(vii) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥපනත ;

(viii) විනෝද බදු ආඥපනත ;

(ix) ආහාර හා ඖෂධ ආඥපනත ;

(x) නිවාස හා නගර සංවර්ධන ආඥපනත ;

(xi ප්‍රාදේශිය බලමංඩලවල ඡන්ද විමසීම් ආඥපනත;

(xii) ජලභීතිකා රෝග ආඥපනත ;

(xiii) වීදි සම්මාදම් ආඥපනත ;

(xiv) නගර හා ග්‍රාම නිර්මාණ ආඥපනත ;

(xv) වාහන ආඥපනත ;

(xvi) මිනුම් හා කිරුම් ආඥපනත, සහ

(බී) (i) නාගරික සභා, පළාත් ආණ්ඩු සභා, සුළු නගර සභා කාර්යාල සංවිධානය, කාර්යාල ක්‍රම හා ක්‍රියා පරිපාටිය.

(ii) සිංහල, දෙමළ සහ මුස්ලිම් ජාතික නිළධාරීන් එක භාෂාවකින් සහ ගිණුම් පත්‍රයෙන් හා පළාත් පාලන නීති පත්‍රයෙන් සමත් විය යුතුයි.

(iii) අනිකුත් ජාතික නිළධාරීන් ගිණුම් සහ පළාත් පාලන නීති පත්‍ර වලින් හා එක් භාෂාවකින් (සාකච්ඡා කිරීම සහ අර්ථ නිරූපනයෙන් පමණක්) සමත් විය යුතුයි.

(iv) ඉහත සඳහන් 7 (බී) සහ (සී) නීති යටතේ ගිණුම් පත්‍රයට සහ පළාත් පාලන නීති පත්‍රයට නියමිත ලකුණු ගණනින් සියයට 40 ක් අයදුම්කරු විසින් ලබාගත යුතුයි.

(v) අයදුම්කරුවකු ඒ විෂයයන් වෙන් වෙන් වශයෙන් වෙනස් වාර වලදී ගැනීමට කැමැත්තේ නම්, ඔහුට එසේ කිරීමට පිළිවන.

8. **නිදහස් කිරීම.**—(i) වයස අවුරුදු 50 ට වැඩි එනම්, 70.7.7 වැනි දිනට 50 (පණස්) වැනි ජන්ම දින ලබන නිළධාරීන්, කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ. එසේ නිදහස් කරනු ලබන්නේ, ඔවුන්ගේ වැඩ සහ හැසිරීම අනුව, එම අනුග්‍රහය දීමට උචිතයයි ද එක් එක් නිළධාරියා එම අනුග්‍රහය ලැබීමට සුදුස්සෙක් යයි ද කොමිෂන් සභාවට ඒත්තු ගියාට පසු පමණය.

(ii) 1946 අප්‍රේල් මස 1 දින පළාත් පාලන සේවයට මාරුකරන ලද සියළුම නිළධාරීන් මෙම විභාගයට නියමිත ජාතික භාෂා ප්‍රශ්න පත්‍රයෙන් නිදහස් කරනු ලැබේ.

(iii) පහත සඳහන් විභාග එකකින්වත් සමත් වී ඇති අපේක්ෂකයෝ සිංහල/දෙමළ භාෂාව පිළිබඳ විෂයයෙන් නිදහස් කරනු ලැබීමට සුදුස්සෝ වෙති :—

(1) සිංහල/දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් උසස් පෙළින් හෝ සාමාන්‍ය පෙළින් හෝ සමත් අපේක්ෂකයෝ.

(2) සිංහල/දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයේ iv වැනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් හෝ v වැනි ශ්‍රේණියේ පරීක්ෂණයත් හෝ සමත් වී ඇති අපේක්ෂකයෝ.

(3) සිංහල/දෙමළ භාෂාමය ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වී ඇති අපේක්ෂකයෝ.

(4) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ විෂයයක් වශයෙන් ඇතිව ඉංග්‍රීසි භාෂාමය ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වී ඇති අපේක්ෂකයෝ.

(5) සිංහල/දෙමළ භාෂාමය ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත් වී ඇති අපේක්ෂකයෝ.

9. සාමාර්ථය ලද අයදුම්කරුවන්ගේ නාමයන් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ ප්‍රසිද්ධ කරනු ලැබේ.

ධර්මසේන විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530,
කොළඹ, 1970 ජූනි මස 7 වැනි දින.

විභාග අංකය :.................
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

## පළාත් පාලන සේවය—අයදුම් පත

**පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ (II වැනි ශ්‍රේණියේ) නිලධාරීන් සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1970**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ප්‍රාදේශීය බලමංඩලයකට පළමු පත්වීම ලද දින සහ පරිවර්තනය කරන ලද සාමාජිකයෙක් ද යන වග :————.
3. පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ දෙවැනි ශ්‍රේණියට පළමුවැනි පත්වීම ලද දිනය :————.
4. දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.
5. අයදුම්කරු දැනට සේවය කරන ප්‍රාදේශීය බලමංඩලයේ නම :————.
6. ගැසට් නිවේදනයේ 7 වැනි ඡේදයේ සිංහල/දෙමළ විෂයයන් ගෙන් නිදහස් කරනු ලැබීමට සුදුසුකම් ඇත්නම්, ඒ පිළිබඳ විස්තර :————.
   (ඒ) සමත් වී ඇති විභාගය :————.
   (බී) විභාගය පැවැත් වූ දිනය :————.
   (සී) විභාග අංකය :————.
7. මීට පෙර ඔබ සමත් වූ විෂයයන් සහ සමත් වූ වර්ෂය:————.
8. ඔබ ගන්නා විෂයයන් සඳහන් කරන්න :————.
   (i) ගිණුම් හා පළාත් පාලන නීති :————.
   (ii) සිංහල (ඒ) සාකච්ඡාව හා අර්ථ නිරූපනය :————.
   (බී) කියවීම හා ලිවීම :————.
   (iii) දෙමළ (ඒ) සාකච්ඡාව හා අර්ථ නිරූපනය :————.
   (බී) කියවීම හා ලිවීම :————.

**සැළකිය යුතුයි.**—සිංහල/දෙමළ පරීක්ෂණය කොටස් දෙකකින් යුක්තයි. (ඒ) සාකච්ඡාව හා අර්ථ නිරූපනය (බී) කියවීම හා ලිවීම.

9. විභාගයට පෙනී සිටින්නේ පහත සඳහන් කුමණ මාධ්‍යයකින්ද:
   (i) සිංහල :————.
   (ii) දෙමළ :————.
   (iii) ඉංග්‍රීසි :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : 1970......මස......වැනි දින,
ප. පා. සේ. කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530, කොළඹ.

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම ප්‍රාදේශීය බලමංඩලයේ සේවයේ යෙදී සිටින බවත්, ඔහු පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වැනි ශ්‍රේණියේ සිටින බවත්, සහතික කරමි. ඔහු ඉහත සඳහන් විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකි. ඔහු, ඔහුගේ අයදුම් පතේ දී ඇති විස්තරය නිවැරදි වේ.

.............................................
නාගරික කොමසාරිස්/සභාපති,
නාගරික සභාව/පළාත් ආණ්ඩු සභාව.

දිනය : 1970......මස......දින.

6–510—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

**පළාත් පාලන සේවයේ I, II හා III වැනි ශ්‍රේණීන්හි විදුලිය අධිකාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය, 1970.8.20**

පළාත් පාලන සේවයේ I, II හා III වැනි ශ්‍රේණීන්හි විදුලිය අධිකාරීන් සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කොළඹ දී පවත්වනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—තමා දරණ තනතුරට වඩා උසස් ශ්‍රේණියක විභාගයකට පෙනී සිටීමට කිසිම නිලධාරියෙකුට අවසර දෙනු නොලැබේ.

2. **අයදුම්පත්.**—(ඒ) විභාගයට ඇතුළත්වීමේ අයදුම්පත් මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට, "ලේකම්, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට එවිය යුතුයි.

(බී) අයදුම්පත් 1970. 7. 7. වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(සී) අයදුම්කරුවන් සිය අයදුම්පත්, තමා දැනට සේවයේ නියුක්ත ප්‍රාදේශිය බලමණ්ඩලයේ ප්‍රධානතැනගේ මාර්ගයෙන් එවිය යුතුය. මෙසේ කිරීමට යම් අපේක්ෂකයකු අපොහොසත් වුවහොත්, ඔහු නුසුදුස්සෙකු ලෙස සළකනු ලැබේ.

(ඩී) 1970.7.7 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා වෙත සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

3. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) පිළිගනු ලැබූ අයදුම්පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් ප්‍රවේශපත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ, ස්වකීය ප්‍රවේශපත්‍ර විභාගය පරිපාලනය සඳහා පත්කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශපත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත්කරනු ලැබේ.

(ii) අයදුම්කරුවන් තමාට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(iii) විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයේදී ස්වකීය ප්‍රවේශපත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි.

(iv) ප්‍රවේශපත්‍රයත් සමග කාල සටහන් පිටපතක්ද අයදුම්කරුවන්ට එවනු ලැබේ.

(v) විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් පළමු ස්වකීය ප්‍රවේශපත්‍රය නොලැබුණහොත්, ඒ බව වහාම. "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට දැනුම් දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතුය: —

(i) විභාගයේ නම :————.
(ii) අයදුම්කරුගේ නම :————.
(iii) සම්පූර්ණ ලිපිනය :————.

4. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පිළිවන.

5. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පිළිගනු ලැබූ අයදුම්පත් හිමි, ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස, ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

6. **හඳුනා ගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තුගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) තැපැල් පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක්,

(බී) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3ක කාලසීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්,

(ඊ) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3ක කාලසීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බල පත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්,

(ඊ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයෙකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසුපිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක් :—

පසුපිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ............................අයගේ බව මම සහතික කරමි.
(අයදුම්කරුගේ නම)

....................................
(අයදුම්කරුගේ අත්සන)

..............................................
(අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන).

නම හා තරාතිරම :————.

ලිපිනය :————.

විභාග ශාලාවේදී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

7. විභාග පරිපාටිය.—විභාගයේ විෂයයෝ පහත දක්වෙයි :—

ලකුණු

(i) දෙපාර්තමේන්තු සංවිධානය සහ මුදල් කටයුතු (පැය 3ක ප්‍රශ්න පත්‍රයකි) ... 100

කාර්මික, ලිපිකරු හා කම්කරු කාර්ය මණ්ඩල අතර වැඩ බෙදා හැරීමත් ඇතුළුව ප්‍රාදේශීය බලමණ්ඩලයන් සඳහා විදුලිය යෝජනා ක්‍රම සංවිධානය, බෙදා හැරීම් ක්‍රමය, බලාගාරය, කම්හල හා ගබඩාව නඩත්තු කිරීම, ගිණුම් පොත් තබා ගැනීම, ගිණුම් සහ ඇස්තමේන්තු පිළියෙල කිරීම, ලිපි ගනුදෙනු හා ලිපි ගොනු කිරීම පිළිබඳ ක්‍රියා මාර්ගය, මුදල් හා පාලන රෙගුලාසි, වැටුප්, ගමන් වියදම්, යැපීම් හා වෙනත් දීමනා, විදුලිය හා යටත් කාර්මික හා ලිපිකරු නිලධාරීන්ගේ නිවාඩු, නිවාඩු කාල නිදහස් දුම්රිය බලපත්‍ර, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල වැඩ සඳහා ක්‍රියා මාර්ගය, අර්ධ ආණ්ඩු දෙපාර්තමේන්තු හා පෞද්ගලික අංශ යන්, ඉන්ඩෙන්ට් ටැන්ඩර්පත්‍ර හා කොන්ත්‍රාත් පිළිබඳ ක්‍රියා මාර්ගය, ගබඩා භාරය, පරීක්ෂාව හා හරි වැරදි බැලීම ආදී කරුණු පිළිබඳ ප්‍රශ්න පිළියෙල කරනු ලැබේ.

(2) විදුලිය ඉංජිනේරු ශිල්පය—I (පැය 3ක ප්‍රශ්න පත්‍රයකි) ... ... ... 100

(අ) ස්ථිති විද්‍යුත්වය, විද්‍යුත් චුම්බකත්වය, විද්‍යුත් සහ චුම්බක ක්ෂේත්‍රවල මූලික සංකල්ප සංවර්ධනය, සන්නායකවල සරල පද්ධතිවල ධාරිතා බලය සහ ස්වීය හා අන්‍යෝන්‍ය ප්‍රේරණ සංගුණකය—විද්‍යුත් චුම්බක ආකෘතියේ සහ ප්‍රේරිත විද්‍යුත් ගාමක බලය පිළිබඳ සරල නිදර්ශන ආදිය ගැන ප්‍රශ්න පිළියෙල කරනු ලැබේ.

(ආ) පරිවර්තක සහ විදුලි යන්ත්‍රාගාරය—මේ විෂයේ දී තනි කලා පරිනාමකයන්ගේ මූලික ප්‍රතිපත්ති, සමක පරිපථ හා දෛශික රූප සටහන්, බලය, උපකරණ හා අධික සංඛ්‍යාත යෝජනා සඳහා විශේෂ ලක්ෂණ පිළිබඳ ප්‍රශ්න පිළියෙල කරනු ලැබේ.

සමකාලික හා ප්‍රේරණ ජනකවල ප්‍රත්‍යාවර්තකධාරා සහ මෝටර් යන්ත්‍ර, සරල ධාරා ශ්‍රේණි, උප පථ හා සංයුක්ත ජනකය සහ මෝටර් යන්ත්‍ර පිළිබඳ මූලික ක්‍රියාකාරී ලක්ෂණ, අමේචර ප්‍රතික්‍රියාව හා කාන්දු ප්‍රතිබාධකය, මෝටර් යන්ත්‍ර සැර ඇමීමේ මූලධර්ම, සමාන්තර ක්‍රියාකාරී පරිවර්තක හා ජනක, ප්‍රත්‍යාවර්තක සමකාලික කිරීම.

(2) විදුලිය ඉංජිනේරු ශිල්පය—2 (පැය 3ක ප්‍රශ්න පත්‍රයකි) ... ... 100

ජනනය, සම්ප්‍රේෂණය, ව්‍යාප්තිය හා ප්‍රයෝජනයට ගැනීම—මේ ප්‍රශ්න පත්‍රයට, ඩීසල් බල මධ්‍යස්ථාන, ඒකකයකට ජනක වියදම, සිසිල් ක්‍රමය, ආරක්ෂක ක්‍රමය, විදුලිය සැපයුම් ක්‍රමය ක්‍රියාකාරී වෝල්ටියතාව, සරල සම්ප්‍රේෂණ මාර්ගය, මුදුන් මාර්ග හා බිම යට කේබල් සම්ප්‍රේෂණය හා ව්‍යාප්ති පද්ධතියේ සැලැස්ම, මාර්ග උපකාරක, ව්‍යාප්තියේ ගණන් බැලීම, සරල ජාලා ගණනය, බල සාධකයේ දියුණුව, කම්බි පරිපථ ස්ථාපනයේ සැලැස්ම, විද්‍යුත් ඉංජිනේරු ආයතනයේ රෙගුලාසි, භූගත කිරීම, ස්විච් සහ සේව නුල් ගියරය, විද්‍යුත් ශක්ති, ආරෝපණ ක්‍රමය සාමාන්‍ය කම්හල් ක්‍රියා කරවීම්, සේවා සම්බන්ධ කිරීම, උප බලස්ථාන, පොම්ප සහ විදුලි බල යෙන් පොම්ප කිරීමේ වියදම, ප්‍රදීපනය, 1950 අංක 19 දරන විදුලිය ආඥාපනත සහ 1957 අංක 59 දරණ විදුලිය (සංශෝධන) ආඥාපනත සහ ඒ යටතේ සම්පාදිත රෙගුලාසි.

සැ. යු.—සාමාර්ථ්‍යයක් සඳහා, සුදුස්සෙකු වීමට අපේක්ෂකයන් විසින් ඉහත අංක 1 දරණ විෂයයට නියමිත සම්පූර්ණ ලකුණු ගණනින් අඩුම වශයෙන් සියයට 40 කුත්, අංක 2 හා 3 දරණ විෂයයන්ට නියමිත සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් වෙන වෙනම එකකට අඩුම වශයෙන් ලකුණු සියයට 50 කුත් ලබා ගත යුතුයි.

8. සමත්වන අයදුම්කරුවන්ගේ නම්, ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කරනු ලැබේ.

ධර්මසේන විජේසිංහ,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1970 ජූනි මස 7 වැනි දින,
කොළඹ,
තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

විභාග අංකය :————.
(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)

## අයදුම් පත්‍රය

**පළාත් පාලන සේවය—ප. පා. සේ. I, II හා III වැනි ශ්‍රේණියන්හි විදුලිය අධිකාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1970.8.20**

සැ. යු.—මෙම ආකෘතිපත්‍රය අපේක්ෂකයාගේ අත් අකුරින් නිවැරදිවද, පැහැදිලිව ද පුරවා, "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට ලැබෙන සේ, අපේක්ෂකයා දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා මගින් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

1. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
2. පළාත් පාලන සේවයට පළමු පත්වීම ලද දින :————.
3. I වැනි ශ්‍රේණියේද, II වැනි ශ්‍රේණියේද නැතහොත් III වැනි ශ්‍රේණියේද යන්න සඳහන් කරන්න :————.
4. දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.
5. දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :————.
6. ඔබ පෙනී සිටීමට අදහස් කරන විෂයයන් සඳහන් කරන්න :—
   (i) දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල් :————.
   (ii) විදුලිය ඉංජිනේරු වැඩ—I :————.
   (iii) විදුලිය ඉංජිනේරු වැඩ—II :————.
7. ඔබ මීට පෙර විභාගයකට පෙනී සිටියේ නම් සමත් කළ විෂයයන් හා විභාගයේ වර්ෂය :————.

..........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ලේකම්,
ප. පා. සේ. කො. සභාව,
කොළඹ.

මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ නියුක්ත ඉහත නම් සඳහන් නිලධාරියා........................දින සිට ................ ........................ වශයෙන් සේවය කරන බවත්, ඔහුගේ සේවය සෑම විටම සතුටුදායක වූ බවත් සහතික කරමි. ඔහු විසින් මෙම ආකෘති පත්‍රයේ දක්වා ඇති විස්තර නිවැරදි බවත් සහතික කරමි.

..........................................
නා.ස./ප.ආ.ස/සු.න.ස./නා.කො./
වි.කො./සභාපතිතුමාගේ අත්සන.

1970 .................. මස .................. දින.

## පළාත් පාලන සේවය

**2 වැනි ශ්‍රේණියේ විධායක ලිපිකරු පංතියට උසස් කිරීමේ විභාගය 1969.7.20**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල, අනුව, පහත නම් සඳහන් අපේක්ෂකයින් 2 වැනි ශ්‍රේණියේ විධායක ලිපිකරු පංතියට පත් කිරීම සඳහා තෝරා ගන්නා ලද බව මෙයින් දන්වනු ලැබේ.

'ඒ' ප්‍රදේශය

| නම | | ප්‍රාදේශීය බලමණ්ඩලය |
|---|---|---|
| එම්. ටී. පී. පීරිස් | ... | මොරටුව ප. ආ. ස. |
| ඩබ්ලිව්. එස්. කමලසිරි | ... | කොළඹ නා. ස. |
| ඩී. එස්. සමරවීර | ... | කොළඹ නා. ස. |
| ඒ. එච්. කේ. පියසේන | ... | ජාඇල පා. ආ. ස. |
| ඩබ්ලිව්. ජී. ද සිල්වා | ... | අළුත්ගම සු. න. ස. |
| කේ. ඩබ්ලිව්. ඒ. ද සිල්වා | ... | වැලිගම ප. ආ. ස |
| ඩී. ඩී. ලියනගේ | ... | කෝට්ටේ ප. ආ. ස. |
| ටී. එස්. රාජපක්ෂ | ... | කොටිකාවත්ත සු. න. ස. |
| එම්. හේමදාස | ... | ගාල්ල නා. ස. |
| කේ. කේ. රූපරත්න | ... | බලපිටිය සු. න. ස. |
| ඩබ්ලිව්. ඩබ්ලිව්. ගුණවර්ධන | ... | කොළඹ නා. ස. |
| බී. ජයතිස්ස | ... | මහරගම සු. න. ස. |
| ඩබ්ලිව්. විජේනායක | ... | කොළඹ නා. ස. |
| කේ. එල්. ගුණවර්ධන | ... | දෙහිවල නා. ස. |
| එස්. සී. කරුණාරත්න | ... | කොළඹ නා. ස. |
| එච්. ඒ. එල්. ටී. ඩලිඩබ්ව් ගුණතිලක | ... | පානදුරා තල්පිටිදෙබද්ද ග. ස. |
| ඩී. එම්. ඊ. තොටවත්ත | ... | දෙහිවල නා. ස. |
| අයි. එම්. ඩී. කේ ද ඒ. එස්. ජයසුන්දර | ... | බත්තරමුල්ල සු. න. ස. |
| ඩබ්ලිව්. ඒ. ජේ. පෙරේරා | ... | කොළඹ නා. ස. |
| එස්. කරුණානායක | ... | අහංගම සු. න. ස. |
| එම්. පී. දයාරත්න | ... | කොළඹ නා. ස. |
| ආර්. ඒ. ජයතිලක | ... | කොළඹ නා. ස. |

'බී' ප්‍රදේශය

| නම | | ප්‍රාදේශීය බලමණ්ඩලය |
|---|---|---|
| එම්. ඩබ්ලිව්. පියසේන | ... | රත්නපුර නා. ස. |
| ඩී. එම්. ගුණසේන | ... | රත්නපුර නා. ස. |
| එච්. එස්. මිල්හුසේන් | ... | නාවලපිටිය පා. ආ. ස. |
| එස්. එම්. විතානගේ | ... | මහනුවර නා. ස. |
| ජී. පී. ආර්. ගොඩගම | ... | මහනුවර නා. ස. |
| කේ. ජී. අබේසිංහ | ... | මහනුවර නා. ස. |
| යූ. චන්ද්‍රතිලක | ... | බදුල්ල නා. ස. |
| ඒ. එම්. රණවීර | ... | වත්තේගම සු. න. ස. |
| ඒ. එම්. සෙනෙවිරත්න | ... | වැලිමඩ සු. න. ස. |

'සී' ප්‍රදේශය

| | | |
|---|---|---|
| ඒ. පී. විජයරත්නම් | ... | යාපනය නා. ස. |
| වී. රත්නහරන් | ... | යාපනය නා. ස. |
| එස්. තර්මලිංගම් | ... | මන්නාරම සු. න. ස. |
| එස්. මහේන්ද්‍රන් | ... | නාවිතන්වෙලි ග. ස. |
| ඒ. වඩිවේලු | ... | පොයින්ට්පේද්‍රෝ සු. න. ස. |
| ටී. බී. ඇන්ටනි | ... | ත්‍රිකුණාමලය ප. ආ. ස. |
| එස්. කන්දසාමි | ... | කල්මුනේ සු. න. ස. |

මෙම අපේක්ෂකයින්ට වහාම පත්වීම් ලබා දීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජූනි මස 7 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

6–509—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී. 19/63

## යටියන්තොට සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

(256 වැනි අධිකාරය වූ) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්තිය යටතේ යටියන්තොට සුළු නගර සභාව විසින් සම්පාදනය කරනු ලදුව පළාත් පාලන ඇමතිවරයා විසින් එකී ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මැයි මස 12 දින,
කොළඹදී ය.

## අතුරු ව්‍යවස්ථාව

**තාවකාලික ඉදිකිරීම්**

1. 1965.12.3 වැනි දින අංක 14,576 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත තාවකාලික ඉදිකිරීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල ඇති උපලේඛණය වෙනුවට මෙහිවූ උපලේඛනය ආදේශ කිරීමෙන් ඒ ව්‍යවස්ථා මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**උපලේඛනය**

**බලපත්‍රය නිකුත් කරනු ලබන කාල සීමාව**

| | | රු. ශ. |
|---|---|---|
| (අ) මාසයකට වැඩි නොවන අවස්ථාවක | ... | 2 50 |
| (ආ) මාසයකට වැඩි වන අවස්ථාවක, සෑම අතිරේක මාසයකට හෝ ඉන් කොටසකට | ... | 2 50 |

6–355—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

# පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 ජූනි මස 8 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| මාතලේ දිස්ත්‍රික්කය | | |
| ඉනාමළුව කෝරළේ ගම්සභාව | | |
| 15 | ... | අළුත්ගෙදර පුංචි බණ්ඩා |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | |
| මින්නේරිය ගම් සභාව | | |
| 5 | ... | ඒකනායක මුදියන්සේලාගේ කරුණාරත්න |

6–471—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

### 1967 වර්ෂයේ ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ. සාමාන්‍ය ආදයම ... ... | | 2,67,626 44 |
| බී. පොදු මංමාවත් ... ... | | 3,861 60 |
| සී.—කානායම් හා අම්බලම් ... | | 10,709 28 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | | 9,040 75 |
| ඊ.—මහජන සුවය ... ... | | 56,531 19 |
| එප්.—පොදු ක්‍රීඩා ... ... | | 39,475 35 |
| ජී.—සොහොන් බිම් ... ... | | 841 50 |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... | | 77 0 |
| අයි.—තරාදි පඩි සහ සේරු ... | | 1,553 10 |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව ... | | 3,70,467 36 |
| එම්.—කියවීම් ශාලා ... ... | | 291 25 |
| | | 7,60,474 82 |
| තැන්පත් ... ... | 52,189 40 | |
| අත්තිකාරම් ... ... | 25,467 86 | |
| වෙළඳ පොළ ණය ... ... | 1,44,750 0 | |
| කානායම් දීමනා ... ... | 1,486 30 | |
| පුස්තකාල දීමනා ... ... | 1,000 0 | |
| මතුපිට කාණු ක්‍රමය ... ... | 70,000 0 | |
| ක්ෂයවීමේ ගිණුම ... ... | 5,000 0 | |
| | | 2,99,893 56 |
| 66.12.31 ඉතිරි (මුදල් පොතේ) | | 2,24,541 68 |
| | | 12,84,910 06 |

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ. සාමාන්‍ය වියදම් ... ... | | 1,02,422 53 |
| බී. පොදු මංමාවත් ... ... | | 80,632 55 |
| සී.—කානායම් සහ අම්බලම් ... | | 8,951 62 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | | 33,797 81 |
| ඊ.—මහජන සුවය ... ... | | 1,97,076 54 |
| එප්.—පොදු ක්‍රීඩා ... ... | | 3,951 02 |
| ජී.—සොහොන් බිම් ... ... | | 4,018 91 |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... | | 449 0 |
| අයි.—තරාදි පඩි සහ සේරු ... | | 49 75 |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව ... | | 2,77,476 42 |
| එම්.—කියවීම් ශාලා ... ... | | 10,519 48 |
| | | 7,19,345 63 |
| තැන්පත් ... ... | 39,896 81 | |
| අත්තිකාරම් ... ... | 1,08,170 69 | |
| කිර තැන්පත් ... ... | 3,647 34 | |
| | | 1,51,714 84 |
| 67.12.31 දින මුදල් පොතේ ඉතිරි ... | | 4,13,849 59 |
| | | 12,84,910 06 |

ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ, 1967 දෙසැම්බර් 31 දිනට දක්වෙන පූර්වෝක්ත ආදයම් සහ වියදම් ප්‍රකාශය එම සභාවේ සභාපති, දෙන් ගුණපාල වීරතුංග වන මම මගේ උසස් ම දැනීමේ හා විශ්වාසයේ අන්දමට නිවැරදි හා සත්‍ය ප්‍රකාශයන් බවට මෙයින් සහතික කරමි.

ඩී. ජී. වීරතුංග,
ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

ඩී. දිසානායක,
අංක 4 කොට්ඨාශයේ නියෝජිත,
ගම්පහ නගර සභාව.

1968 ජූලි මස 25 වෙනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඒ. වී. බස්නායක,
සමාදාන විනිශ්චයකාරතැන.

නගර සභා කාර්යාලයය,
ගම්පහ, 1968 ජූලි 25 ද.

## ගම්පහ නගර සභාව

### 1967 දෙසැම්බර් 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශනය

| බැරකම් | | | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් මුදල් ... ... | | | 76,257 42 |
| විදුලිය දෙපාර්තමේන්තුවේ ක්ෂයවීමේ ගිණුම ... ... | | | 75,000 0 |
| පුස්තකාලය සඳහා දීමනාව ... ... | | | 1,006 21 |
| කානායමේ වැඩි දියුණු කිරීම සඳහා දීමනාව ... ... | | | 2,236 30 |
| වෙළඳ පොළ සඳහා ණය මුදල ... | | | 1,44,750 0 |
| මතුපිට කාණු ක්‍රමය සඳහා දීමනාව ... ... | | | 70,000 0 |
| 1966.12.31ට අධිකය ... | | 2,63,312 19 | |
| 1967 වර්ෂයේ ආදයම ... | 7,60,474 82 | | |
| 1967 වර්ෂයේ වියදම ... | 7,19,345 63 | | |
| 1967 වර්ෂයේ අධිකය | | 41,129 19 | |
| 1967.12.31 දිනට අධිකය ... | | | 3,04,441 38 |
| | | | 6,73,691 31 |

| වත්කම් | රු. ශ. |
|---|---|
| අත්තිකාරම් ... ... ... | 1,33,616 23 |
| ලංකා බැංකුවේ ස්ථිර තැන්පත් ... ... | 1,25,225 49 |
| මහජන බැංකුවේ තැන්පත් ... ... | 1,000 0 |
| 1967.12.31 ඉතිරි මුදල් ... ... ... | 4,13,849 59 |
| | 6,73,691 31 |

ගම්පහ නගර සභාවේ 1967 දෙසැම්බර් 31 දිනට දක්වෙන පූර්වෝක්ත වත්කම් හා බැරකම් ප්‍රකාශය එම සභාවේ සභාපති, දෙන් ගුණපාල වීරතුංග වන මම මගේ උපස්ම දනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

සී. ජී. වීරතුංග,
ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

ඩී. දිසානායක,
අංක 4 කොට්ඨාශයේ සභික,
ගම්පහ නගර සභාව.

1968 ජූලි මස 25 දින මා ඉදිරිපිට දී සහතික කරන ලදී.

ජී. ටී. බස්නායක,
සමාදන විනිශ්වයකාරතැන.

නගර සභා කාර්යාලය,
ගම්පහ, 1968.6.4 ද.

6–360—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## මොරටුව නගර සභාව

### අතිරේක අය-වැය ලේඛනය අංක 2—1970

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. | බලය |
|---|---|---|---|
| ජී.—1 (සී) පියුන්වරු ... ... ... ... | 7,458 | 61 | ... යෝජනා අංක 9 සහ 10.4.70 දින |
| ජී.—2 (එච්) වාහන, බෝට්ටු හා වරිපනම් හතඩු ගාස්තු ... ... | 700 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| බී.—3 යන්ත්‍ර හා ආයුධ ... ... ... ... | 7,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| බී.—4 (බී) විදුලි බුබුළු මිලට ගැනීම ... ... ... | 10,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| බී.—4 (සී) පහන් සවිකරන උපකරන මිලට ගැනීම ... ... ... | 25,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ඩී.—7 නව කර්මාන්ත ... ... ... ... | 35,000 | 0 | ... යෝජනා අංක 115 සහ 29.1.70 දින |
| ඊ.—1 (සී) නිල ඇඳුම් ... ... ... ... | 2,500 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ඊ.—1 (බී) දීමනා—විවාහක ... ... ... ... | 6,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ඊ.—2 (ඒ) වේතන ... ... ... ... | 25 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ඊ.—3 (ඒ) වේතන ... ... ... ... | 150 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ඊ.—3 (ජී) ඉදිකිරීම ... ... ... ... | 2,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ජේ.—2 (සී) මීටර් ස්විච් යතුරු සහ වෙනත් උපකරණ ... ... | 5,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ජේ.—2 (ඩී) වේග සම්පාදක විදුලි කම්බි, විදුලි බලපෝෂණ මධ්‍යස්ථාන සහ උප මධ්‍යස්ථාන | 5,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ජේ.—3 (ඒ) උපකරණ ... ... ... ... | 25,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ජේ.—3 (ඊ) මීටර් මිලයට ගැනීම ... ... ... | 10,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |
| ජේ.—6 (බී) කම්කරු වැඩ ... ... ... | 4,000 | 0 | ... යෝජනා අංක 19 සහ 12.5.70 දින |

1970.6.3 වැනි දින,
මොරටු නගර සභා කාර්‍යාලයේ දී ය.

ජයසුමන ධර්මබන්ධු,
මොරටු නගර සභාවේ සභාපති.

6–359—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## දඹුල්ල සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40 (2) යටතේ කෙරෙන අයදුම් පත්‍රයයි

### 1970 වර්ෂයේ අය-වැය ලේඛනය

වර්ෂ 1970 අය වැය ලේඛණයේ මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි පහත දක්වා ඇතිපරිදි මුදල් මාරු කිරීමට, 1970 අප්‍රියෙල් මස 29 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී අංක 5 (IV) දරණ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලදී.

| ඉතිරි මුදල් වැය ශීර්ෂය | රු. | ශ. | වැඩිපුර වියදම් වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඩී.—සනීපාරක්ෂාව :— | | | ඩී.—සනීපාරක්ෂාව :— | | |
| (5) ජල සම්පාදනය— | | | (5) ජල සම්පාදනය— | | |
| (ඊ) ඉදි කිරීම් ... ... ... | 406 | 0 | (එච්) ප්‍රසිද්ධ නාන ස්ථාන ... ... | 403 | 0 |
| | 406 | 0 | | 406 | 0 |

හෙ. වි. ප්‍රේමතිලක,
සභාපති,
සුළු නගර සභාව, දඹුල්ල.

1970 මැයි මස 7 වෙනි දින,
දඹුල්ල සුළු නගර සභා කාර්‍යාලයේ දී ය.

අනුමත කරමි.

කේ. එම්. අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, මාතලේ.

1970 ජූනි මස 6 වෙනි දින,
මාතලේ පළාත් පාලන කාර්‍යාලයේ දී ය.

6–504—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## හොරණ නගර සභාව

### අතිරේක අය-වැය ලේඛනය අංක 1—1970

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. | යෝජනා අංකය |
|---|---|---|---|
| ජී.—2 (ඇම්) නිල ඇඳුම් | 11 | 0 | 4.4.70 දින අංක 6 දරණ යෝජනාව |
| ඊ.—1 (ඇෆ්) උපකරණ සහ බෙහෙත් | 400 | 0 | 6.6.70 දින අංක 2 (5) දරණ යෝජනාව |
| ඊ.—1 (ජේ) කිරි පරීක්ෂක ගාස්තු | 200 | 0 | එම |
| ජේ.—2 (සී) මීටර්, ස්විච් සහ වෙනත් උපකරණ | 5,000 | 0 | 4.4.70 දින අංක 1 දරණ යෝජනාව |
| ජේ.—3 (ඒ) උපකරණ | 15,000 | 0 | එම |

ඩබ්ලිව්. ඇම්. ෆොන්සේකා,
සභාපති,
හොරණ නගර සභාව.

නගර සභා කායර්‍යාලය,
හොරණ, 1970.6.7.

6–507—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## රක්වාන සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (ii) යටතේ කෙරෙන අයදුම්පතයි

1970 වර්ෂයේ අයවැය ලේඛනයේ ඒ ඒ සිරස් යටතේ වෙන් කරන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍ය වී ඇති අතිරේක වැය සඳහා එම සිරස් යටතේ යෙදවීමට 1970 මැයි මස 25 වෙනි දින පවත්වන ලද මෙම සුළු නගර සභාවේ මහා සභා රැස්වීමේදී යෝජනා අංක 4 යටතේ සම්මත විය.

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | | රු. | ශ. |
|---|---|---|---|
| ඩී.—3 (ජී) | ඉදිකිරීම් | 1,000 | 0 |
| ඩී.—5 (සී) | නඩත්තු කිරීම් | 1,000 | 0 |
| අයි.—1 | ගිනිනාශක බඳුන් | 300 | 0 |
| ඊ.—2 (කේ) | කාර්යාල භාණ්ඩ | 450 | 0 |
| | | 2,750 | 0 |

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | | රු. | ශ. |
|---|---|---|---|
| සී.—4 | නඩත්තු කිරීම් | 500 | 0 |
| සී.—7 | නව කර්මාන්ත | 2,250 | 0 |
| | | 2,750 | 0 |

වී. ටී. ජී. කරුණාරත්න,
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

1970 ක් වූ ජූනි මස 5 වෙනි දින,
රක්වාන සුළු නගර සභා කාර්යාලයේ දී ය.

6–350—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## නාරම්මල උප නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40 (ii) යටතේ අයදුම්පත (I)

### 1970 අය–වැය ලේඛනය—1 කොටස (සාමාන්‍ය)

මෙහි පහත ඉතිරි වැය ශීර්ෂ යටතේ දක්වෙන මුදල් ඒ සමග දක්වෙන වැඩිපුර වියදම් යටතේ සඳහන් ශීර්ෂවලට මාරුකර වැය කිරීමට 70.3.31 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 7 (1) දරණ යෝජනාව යටතේ සභා සම්මත කර ගන්නා ලදී.

**ඉතිරි මුදල් වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| **ඒ.—සාමාන්‍ය වියදම් :—** | | |
| (1) නිළධාරීන්ගේ වැටුප් (අන් අන්දමකින් වෙන් නොකල)— | | |
| (ජී) ජීවනාධාර | 12,120 | 0 |
| **බී.—මංමාවත් :—** | | |
| (13) ජීවනාධාර | 5,532 | 0 |
| **ඩී.—මහජන සෞඛ්‍යය :—** | | |
| (1) සාමාන්‍ය— | | |
| (ඕ) ජීවනාධාර | 420 | 0 |
| (2) කැලිකසල ශෝධනය— | | |
| (ඊ) ජීවනාධාර | 6,700 | 0 |
| (3) වැසිකිළි ශෝධනය— | | |
| (එච්) ජීවනාධාර | 4,600 | 0 |
| (5) ජල සම්පාදනය— | | |
| (අයි) ජීවනාධාර | 1,500 | 0 |
| (6) රෝහල්— | | |
| (ඩී) ජීවනාධාර | 4,875 | 0 |
| (7) පොදු වෙළඳපොලවල් හා ගාල්— | | |
| (ඩී) ඉදිකිරීම් | 5,000 | 0 |
| **ජේ.—කියවීම්ශාලා හා පුස්තකාල :—** | | |
| (6) ජීවනාධාර | 2,960 | 0 |
| | 43,707 | 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| **ඒ.—සාමාන්‍ය වියදම් :—** | | |
| (1) නිළධාරීන්ගේ වැටුප් (අන් අන්දමකින් වෙන් නොකල)— | | |
| (ඒ) ලේකම් | 1,870 | 0 |
| (බී) ලිපිකරුවෝ | 5,520 | 0 |
| (සී) ආදායම් පරීක්ෂකයින් | 1,815 | 0 |
| (ඩී) කාර්යාල සේවකයින් | 2,915 | 0 |
| **බී.—මංමාවත් :—** | | |
| 1 (සී) කම්කරුවෝ | 5,532 | 0 |
| **ඩී.—මහජන සෞඛ්‍යය :—** | | |
| (1) සාමාන්‍ය— | | |
| (බී) දෛනික වැටුප් | 420 | 0 |
| (2) කැලිකසල ශෝධනය— | | |
| (ඒ) දෛනික වැටුප් | 6,700 | 0 |
| (3) වැසිකිළි ශෝධනය— | | |
| (ඒ) දෛනික වැටුප් | 4,600 | 0 |
| (5) ජල සම්පාදනය— | | |
| (ඒ) දෛනික වැටුප් | 1,500 | 0 |
| (6) රෝහල්— | | |
| (ඒ) වේතන | 4,875 | 0 |
| **සී.—නගරසභා ඉඩම් සහ ගොඩනැගිලි (අන් අන්දමකින් වෙන් නොකල)—** | | |
| (7) නව කර්මාන්ත | 5,000 | 0 |
| **ජේ.—කියවීම්ශාලා හා පුස්තකාල :—** | | |
| (1) වේතන | 2,960 | 0 |
| | 43,707 | 0 |

දෙවන කොටස—විදුලි අංශය

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| 10.—ජීවනාධාර ... ... ... | 9,990 0 | 4.—පාලනය හා සාමාන්‍ය වියදම් :— | |
| | | (ඒ) පාලන, වේතන හා දීමනා (අන් අයුරින් වෙන් නොකල) | 3,937 10 |
| | | (බී) බාහිර සේවක වේතන හා දීමනා ... ... | 6,052 90 |
| | 9,990 0 | | 9,990 0 |

සී. ඇම්. බී. බෝගොල්ලාගම,
සභාපති,
උප නගර සභාව, නාරම්මල.

1970 ක්වූ මැයි මස 10 වෙනි දින,
නාරම්මල උප නගර සභා කාර්යාලයේ දීය.

අනුමත කරන ලදී.

දයානන්ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කුරුණෑගල.

1970 ක්වූ ජූනි මස 5 වෙනි දින,
කුරුණෑගල දී ය.

6–503—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## මාවතගම සුළු නගර සභාව

### නිවැරදි කිරීමයි

1969.12.26 හා අංක 14,886 දරණ ගැසට් පත්‍රයේ පලවී ඇති මාවත ගම සුළු නගරසභාවේ 3 වැනි පරිපූරක අයවැය ලේඛනයේ සඳහන් වී ඇති " ඒ 2 (කේ) විවාහක නිලධාරීන්ට දීමනා රු. 345.00 " යන අයිටමය " ඒ 2 (එල්) විවාහක නිලධාරීන්ට දීමනා රු. 345.00 " යනු වෙන් නිවැරදි විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

හේරත් බී. ඒකනායක,
මාවතගම සුළු නගර සභාවේ සභාපති.

1970.6.5 වැනි දින,
මාවතගම සුළු නගර සභා කාර්යාලයේ දී ය.

6–347—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## කොළොන්නාව නගර සභාව

### වාර්ෂික ගිණුම්—1966

අංක 14,902 සහ 1970.4.17 දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ පිටු අංක 331 හි පලවූ ප්‍රකාශනයන්හි " අංක 8 දරන කොට්ඨාශයේ නියෝජිත " යන ස්ථානයන් හි උඩින් ඇති " බී. ඇත්. සමරකෝන් " යන නම වැරදීමකින් සඳහන් වී ඇති බවත්, " එස්. ජේ. ද සිල්වා " යනුවෙන් එය නිවැරදි විය යුතු බවත්, ප්‍රකාශ කරමි.

සෝමසිරි ගලගෙදර,
සභාපති,
කොළොන්නාව නගර සභාව.

1970 ජූනි මස 8 වෙනි දින,
කොළොන්නාව නගර සභා කාර්යාලය,
වැල්ලම්පිටිය.

6–517—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## තංගල්ල නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරිය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 17 (1) දරණ උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැනවූද, තංගල්ල නගර සභාවේ සභාපති තැනවූද, ඇම්. ඇස්. ගලප්පත්ති වන මම 1970 වර්ෂයේ පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් දිනයෙහි තංගල්ල නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ විකිණීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

### උපලේඛනය

1970 ජූනි 18,

ඇම්. ඇස්. ගලප්පත්ති,
තංගල්ල නගර සභාවේ සභාපති.

නගර සභා කාර්‍ය්‍යාලය,
තංගල්ල.
1970.6.6.

6–505—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## හපුතලේ නගර සභාව

### ජල භීතිකා රෝගය

හපුතලේ නගර සභා සීමාව තුල ජල භීතිකා උවදුර පවතින බැවින් එම නගර සභා සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬුවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියෙකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවෙලේම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශණය මෙදින සිට හය මාසයක කාලයක් බල පවත්වනවා ඇත.

ඇස්. බී. විල්බට් සිල්වා,
සභාපති,
හපුතලේ නගර සභාව.

1970. 6. 2 දින,
හපුතලේ නගරසභාවේදීය.

6–361—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## තෙල්දෙණිය නගරය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම සඳහන් අය, එකී සඳහන් කොට ඇති ස්ථානයේ 1970 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත්කිරීම ගැන තෙල්දෙණිය නගර සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලකින් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 10 ක් ඇතුළතදී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම්දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
| --- | --- |
| ඇස්. ඇම්. රෂීඩ්, කුඹුක්කඳුර, තෙල්දෙණිය | තෙල්දෙණිය ප්‍රසිද්ධ වෙළඳ පොළේ අංක 2 දරන වෙළඳ සැල. ගවමස් වෙළඳාම |

ලී. මූ. සමරසිංහ,<br>
තෙල්දෙණිය නගරයේ විශේෂ කොමසාරිස්.

1970 ජූනි මස 8 වැනි දින,<br>
තෙල්දෙණිය විශේෂ කොමසාරිස් කාර්යාලයේදීය.

6–516—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## දඹුල්ල සුළු නගර සභාව

### 1970 වර්ෂයේ වරිපනම් ලේඛණ

1970 වර්ෂය සඳහා වූ දඹුල්ල සුළු නගර සභාවේ වරිපනම් ලේඛණ දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වෙනි වගන්තියේ කියවෙන පරිදි (252 වෙනි අධිකාරය වන) නාගරික සභා ආඥාපනතේ 235 (1) දරන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

හෙ. වි. ප්‍රේමතිලක,<br>
දඹුල්ල සුළු නගර සභාවේ සභාපති.

1970 ජූනි මස 9 වැනි දින,<br>
දඹුල්ල සුළු නගර සභා කාර්යාලයේදී ය.

6–513—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## රඹුක්කන සුළු නගර සභාව

### 1970 වර්ෂයේ වරිපනම් ලේඛන

1970 වර්ෂය සඳහා වූ රඹුක්කන සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හිදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වැනි අධිකාරිය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියේ කියවෙන පරිදි (252 වැනි අධිකාරිය වන) නාගරික සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඇන්. ඒ. සෙනෙවිරත්න,<br>
රඹුක්කන සුළු නගර සභාවේ සභාපති.

1970 ජූනි මස 6 වැනි දින,<br>
රඹුක්කන සුළු නගර සභා කාර්යාලයේ දීය.

6–500—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## බෙන්තොට සුළු නගර සභාව

### 1970 වරිපණම් ලේඛන

1970 වර්ෂය සඳහා මෙම සුළු නගර සභාවේ වරිපණම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛණ බෙන්තොට සුළු නගර සභා කාර්යාලයේදී, කාර්යාලීය වේලාවන්හිදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත් (256 වෙනි අධිකාරයවූ) සුළු නගරසභා ආඥාපනතේ 165 වෙනි වගන්තියෙන් කියවෙන පරිදි, (252 වෙනි අධිකාරයවූ) මහ නගරසභා ආඥාපනතේ අංක 235 (1) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

චන්ද්‍රරත්න කොලොන්නෙ,<br>
සභාපති,<br>
බෙන්තොට සුළු නගර සභාව.

1970ක්වූ ජූනි මස 8 වැනි දින,<br>
බෙන්තොට සුළු නගර සභා කායභීලයේදීය.

6–512—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## වැලිසර සුළුනගර සභාව

### 1970 වර්ෂයේ වරිපනම් බදු ලේඛන

1970 වර්ෂය සඳහා වූ වැලිසර සුළුනගර සභාවේ කොට්ඨාශ අංක 1 සිට කොට්ඨාශ අංක 6 දක්වා වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එකී ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත් (256 වැනි අධිකාරිය වන) සුළුනගරසභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරිය වන) මහ නගර සභා ආඥා පනතේ 235 (1) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඇන්ටන් අමරසේකර,<br>
සභාපති;<br>
වැලිසර සුළු නගර සභාව.

1970 ජූනි මස 6 වන දින,<br>
වැලිසර සුළු නගර සභා කාර්යාලයේදීය.

6–506—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## බුත්තල ගම් සභාව

**ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)**

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි නම් සඳහන් අය එහි සඳහන් කොට ඇති ස්ථානයේ 1970 වර්ෂයට මස් විකිණීම සඳහා මස් කඩයක් පවත්වාගෙන යෑමට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන බුත්තල ගම්සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහහතරක් ඇතුළත දී මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇස්. ඇම්. ඒ. රසාක්, අංක 58, වැල්ලවාය පාර, මොණරාගල ... | ගවමස් වෙළඳාම ... | බුත්තල පොදු කඩපෙළේ අංක 10 දරණ මස් කඩය |

1970 ජූනි මස 7 වැනි දින,
බුත්තල, ගම්සභා කාර්යාලයේ දී ය.

වී. ඇම්. ජයසුන්දර,
බුත්තල ගම් සභාපති.

6–515—70.6.18. දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය

### උපලේඛනය

### 1970

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| අප්‍රේල් ... | 70 4 3 සිකුරාද ... | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | 70 4.10 සිකුරාද .. | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද .. | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද .. | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්දා .. | 70. 4.23 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| මැයි .. | 70. 5. 8 සිකුරාද ... | 70. 4.30 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද .. | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70 5.29 සිකුරාද ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි ... | 70. 6. 5 සිකුරාද ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්දා ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්දා ... | 70. 6.11 බ්‍රහස්පතින්දා | දහවල් | 12.0 |
| | 70 6.25 බ්‍රහස්පතින්දා ... | 70. 6.18 බ්‍රහස්පතින්දා | දහවල් | 12.0 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.